ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්යාල කාර්ය සහායක — තනතුරු සංඛ්‍යාව : 03

සේවා ගණය : **PL 1**

## තනතුරෙහි ස්වභාවය

- කාර්යාලීය අභ්‍යන්තර සහ බාහිර පරිශ්‍රය පිරිසිදුව හා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස පවත්වාගෙන යාමට අදාල වූ සියලුම කාර්යයක් ඉටු කිරීම
- ආයතනයෙහි යතුරු සේවය සම්බන්ධ කාර්යයන් හා නියමිත වේලාවට අංශ විවෘත කිරීමේ හා වැසීමේ කාර්යයට අදාළ කටයුතු කිරීම
- අංශ අතර රාජකාරි ලිපි, ලිපිගොනු හා පොත්පත් ආදිය ගෙන යාමේ කටයුතු හා අංශ වලට අවශ්‍ය ගබඩා ද්‍රව්‍ය ගෙන ඒමේ කාර්ය ඉටු කිරීම
- තැපැල සම්බන්ධ කටයුතු ඉටු කිරීම
- කාර්යමණ්ඩලයේ රාජකාරි කටයුතුවල දී ඔවුනට සහාය වීම
- අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධරයකු/නිලධාරීන් විසින් ආයතනික සේවා අවශ්‍යතාව අනුව පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම

## සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

## වයස් සීමාව

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය.

## වැටුප් පරිමාණය

**PL 1 - 2025 රු. (40,500 - 10 x 450 - 10 x 490 - 7 x 540 - 15 x 590 - 62,530)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)